රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක:- 304

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.
1985 සැප්තැම්බර් මස 09 දින.

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන් වෙත.

රාජකාරි සඳහා එතෙර යන ඒකාබද්ධ සේවාවල
**නිලධාරියෙකුගේ නිවාඩු සඳහා අනුමතිය.**

ඒකාබද්ධ සේවයක නිලධාරියකු සම්බන්ධයෙන්, ඔහු එතෙර යාම සඳහා අමාත්‍යාංශ ලේකම් මගින් ගරු අමාත්‍යතුමාගේ අනුමතිය ඉල්ලා සිටීමට ප්‍රථම, නිවාඩු සඳහා මගේ අනුමතිය ලබාගැනීම අවශ්‍ය නොවේ.

02. එහෙත්, නිවාඩු අනුමත කිරීමෙන් පසුව, නිලධාරියාගේ හා ගමනේ විස්තර මගේ ලේඛනවල ඇතුලත් කිරීම සඳහා දෙපාර්තමේන්තු ප්‍රධානියා එවිය යුතුය.

03. ගරු අමාත්‍යතුමාගේ අනුමතිය සඳහා වන සෑම ඉල්ලුම් පත්‍රයක්ම, ආයතන සංග්‍රහයේ XV පරිච්ඡේදයේ 10:5 වගන්තියේ දැක්වෙන විධිවිධානයන්ට අනුකූල විය යුතුය. එනම්, නිලධාරියා දිවයිනෙන් බැහැර යන දිනට යටත් පිරිසෙයින් දින දහයකටවත් (10) කලින් නිසි මාර්ගයෙන් අමාත්‍ය ලේකම් වෙත ලැබෙන පරිදි ඉදිරිපත් කළ යුතුය.

04. මෙම චක්‍රලේඛය අමාත්‍ය ලේකම්ගේ එකඟත්වය ඇතිව නිකුත් කරනු ලැබේ.

Siriwardhana
ලේකම්,
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය.